# සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව - දකුණු පළාත
# சுகாதார சேவைத் திணைக்களம் - தென் மாகாணம்
# Department of Health Services - Southern Province

අංක 15 ඒ, පහළ ඩික්සන් පාර, ගාල්ල, ශ්‍රී ලංකාව.
15 ஏ,கீழ டிக்ஸன் பாதை, காலி, ஸ்ரீ லங்கா.
No. 15A, Lower Dickson Rd, Galle, Sri Lanka.

E-mail: pdhssp@yahoo.com
Web : www.healthdept.sp.gov.lk
Skype : Pdhs.sp


මගේ අංකය / My No } SPH/EST/EA/03/.08/2024 ඔබේ අංකය / Your No } දිනය / Date } 2024.06.13

දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,
දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය,
ගාල්ල/මාතර/හම්බන්තොට.

වෛද්‍ය අධිකාරී,මූලික රෝහල,
බලපිටිය/ඇල්පිටිය/උඩුගම/දෙනියාය/කඹුරුපිටිය/තංගල්ල/ වලස්මුල්ල/තිස්සමහාරාම.

සියළුම ආයතන ප්‍රධානීන්,

**<u>වාර්ෂික ස්ථාන මාරු - 2024</u>**
**<u>දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව.</u>**

උක්ත කරුණ සම්බන්ධ මගේ අංක SPH/EST/EA/03/08/2023(iv) හා 2024.01.11 දිනැති ලිපිය මගින් ඉදිරිපත් කළ 2024 වාර්ෂික ස්ථාන මාරු තීරණ හා එම ලිපියේ සඳහන් කරුණු කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එම ස්ථාන මාරු යෝජනා සම්බන්ධව මා වෙත ඉදිරිපත් වූ කරුණු දැක්වීම පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ 254 වගන්තිය ප්‍රකාරව වූ වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු තීරණ මෙම දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය (www.healthdept.sp.gov.lk) වෙත මේ සමඟ මුද්‍රාහැර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. මෙමගින් සිදු කරනු ලැබූ සංශෝධනයන්ට යටත් මගේ අංක SPH/EST/EA/03/08/2023(iv) හා 2024.01.11 දිනැති ලිපිය මගින් යෝජිත 2024 වාර්ෂික ස්ථාන මාරු නියෝග මෙයින් අනුමත කරමි.

03. වාර්ෂික ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කිරීම

(අ) අදාළ නිලධාරියාගේ නම ඉදිරියෙන් ස්ථාන මාරුව ක්‍රියාත්මක වන දිනය සටහන් කර ඇති නිලධාරීන්ගේ ස්ථාන මාරුව එම දන්වා ඇති දින ද, එසේ සඳහන් කර නොමැති අනෙකුත් සියළුම ස්ථාන මාරු 2024.07.01 දින සිට ද ක්‍රියාත්මක කරන ලෙස මෙයින් දැනුම්දෙමි.

(ආ) ඒ අනුව ඔබ ආයතනයේ/ රෝහලේ ස්ථාන මාරුවීම් ලබා ඇති නිලධාරීන් නියමිත දිනයේ නව සේවා ස්ථානයන්හි රාජකාරි භාරගැනීමට හැකිවන පරිදි අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන මුදා හැරීමට කටයුතු කරන ලෙස දන්වා සිටිමි.

(ඇ) 2024 වාර්ෂික ස්ථාන මාරු නියෝගයන්හී සෞඛ්‍ය කාර්ය සහායක (කනිෂ්ඨ) හා සෞඛ්‍ය කාර්ය සහායක (සාමාන්‍ය) තනතුරුවල නාමයෙහි වෙනස්වීම් ඇත්නම් ඒ පිළිබඳව නොසලකා ස්ථාන මාරු ක්‍රියාත්මක කරන ලෙස කාරුණිකව දන්වමි.

(ඈ) එසේම දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ අංක දපස/ප්‍රඅ/සෞ/14/2/2024 හා 2024.05.31 දිනැති ලිපිය මගින් දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ PL-2 උපස්ථායක තනතුරේ III ශ්‍රේණියට සීමිත පදනමින් බඳවා ගැනීමට තෝරා ගන්නා ලද නිලධාරීන් සඳහා ත්‍රෛමාසික පුහුණුවට කැඳවන ලද නිලධාරීන්ගෙන් 2024 වාර්ෂික ස්ථාන මාරු නියෝග ලබා ඇති නිලධාරීන් සිටී නම්, එම නිලධාරීන්ගේ ස්ථාන මාරු තාවකාලිකව අත්හිටුවන ලෙසද, ඔවුන්ගේ අනුප්‍රාප්තික නිලධාරීන්ගේ ස්ථානමාරු ක්‍රියාත්මක කිරීම තුළින් , අදාළ ආයතනයේ රාජකාරී කටයුතු බාධාවක් නොවන පරිදි පවත්වා ගෙන යාමට හැකියාව පවතී නම්, එම ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කළ හැකි බව ද කාරුණිකව දන්වමි.

විශේෂඥ වෛද්‍ය චන්දිම සිරිතුංග
එම්.බී.බී.එස්, එම්.එස්.සී.එම්.ඩී.(ප්‍රජා වෛද්‍ය)
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
දකුණු පළාත

(ඉ) 2024 වාර්ෂික ස්ථාන මාරු නියෝග අනුව නව සේවා ස්ථානයට වාර්තා කරන ලද නිලධරයන්ද, මුදාහල නිලධරයන්ද පිළිබඳව ස්ථාන මාරු ක්‍රියාත්මක වන දින සිට මසක් (01) ඇතුළත මා වෙත වාර්තා කළ යුතුය.

04. එසේම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2310/29 දරණ හා 2022.12.14 දිනැති කාර්ය පටිපාටික රීති (කාණ්ඩ අංක 01) හි XVIII පරිච්ඡේදයේ 257 වගන්තියේ සඳහන් විධිවිධාන කෙරෙහි ද අවධානය යොමු කරවමි.

05. ඒ අනුව මෙහි සඳහන් සියළු ස්ථානමාරු හා වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුවේ තීරණ, ආයතන ප්‍රධානීන් විසින් අදාළ නිලධාරීන් වෙත විධිමත් ලෙස දැන්විය යුතු බවත්, ඒ අනුව අදාළ ස්ථාන මා රු ක්‍රියාත්මක කල යුතු බවත්, සියළු ආයතන ප්‍රධානීන් ඒ සඳහා පෞද්ගලිකව වගකීමට බැඳී සිටින බවත් වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

විශේෂඥ වෛද්‍ය චන්දිම සිරිතුංග
එම්.බී.බී.එස්, එම්.එස්.සී.එම්.ඩී.(ප්‍රජා වෛද්‍ය
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
දකුණු පළාත

විශේෂඥ වෛද්‍ය චන්දිම සිරිතුංග
දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

පිටපත : ලේකම්, දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශය,දකුණු පළාත - කාරු.දැ.ගැ.ස.